ඒකාබද්ධ සේවා චක්‍රලේඛ : 02/2026

මගේ අංකය : CS/VII/GTS/Promotion
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2026.04.29

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**භාෂා පරිවර්තක සේවා ව්‍යවස්ථාව අනුව රජයේ භාෂා පරිවර්තක සේවයේ විශේෂ පන්තියට ජ්‍යෙෂ්ඨතාවය මත උසස් කිරීම**

1994 ජූලි 26 දිනැති අංක 829/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද භාෂා පරිවර්තක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව සහ ඒ සම්බන්ධයෙන් ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/03-05/02/2018 හා 2026.04.21 දිනැති ලිපිය මඟින් ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය අනුව රජයේ භාෂා පරිවර්තක සේවයේ විශේෂ පන්තියට උසස් කිරීම සඳහා රජයේ භාෂා පරිවර්තක සේවයේ නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. 2025.03.25 දිනැති හා අංක 10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 6-2025 (පියවර 23) වැටුප් ඛණ්ඩය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ මාසික වැටුප් පරිමාණය රු.62,230 – 10 x 1190 – 11 x 1360 – 15 x 1670 –114,140 ක් වේ. උක්ත චක්‍රලේඛයට අනුව එම පරිමාණයේ 23 වන පියවර රු. 90,760 වේ.

03. ඇගයීමේ ක්‍රමවේදය :-

I. රජයේ භාෂා පරිවර්තක සේවයේ විශේෂ ශ්‍රේණියේ 2026.03.31 දිනට පවතින පුරප්පාඩුවලින් 40%ක ප්‍රමාණයකට අදාල පත්කිරීම් ජ්‍යෙෂ්ඨතාවය මත සිදු කරනු ලබයි. මේ සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ජ්‍යෙෂ්ඨතාව පදනම් කරගෙන දෙනු ලබන ලකුණුවල එකතුවේ අනුපිළිවෙළ අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ.

II. ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු ප්‍රදානය කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 අනුව වන අතර සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අවම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට (අවුරුදු 10) අමතරව වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණය ද සෙසු නිලධාරීන්ට එම ලකුණු ප්‍රමාණයට සමානුපාතික වන ලෙස ඔවුන්ගේ අමතර සේවා කාලයන් සඳහා ගණනය කරන ලද ලකුණු ප්‍රමාණයක් ද ලබාදෙනු ලැබේ.

04. විශේෂ පන්තියට උසස් කිරීම සඳහා සුදුසුකම්

I. තනතුරේ ස්ථිර කර තිබීම.
II. මෙම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා රජයේ භාෂා පරිවර්තක සේවයේ නිලධාරියෙකු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි MN 6 -2025 වැටුප් කාණ්ඩයේ 22 වෙනි වැටුප් පියවරට එළඹ තිබිය යුතුය.
III. නියමිත කාල පරිච්ඡේදය තුළ අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.
IV. නියමිත කාල පරිච්ඡේදය තුළ දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

05. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල භාෂා පරිවර්තක සේවයට අයත් විශේෂ පන්තියට උසස්වීමට සුදුසුකම් ලබන සියලුම නිලධරයන් මේ සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කරගත් අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානීන් අයදුම්පතෙහි දක්වා ඇති විස්තර නිවැරදි බවට සහතික කර අයදුම්කරුගේ උප්පැන්න සහතිකය, පත්වීම් ලිපිය, ස්ථිර කිරීමේ ලිපිය, අධ්‍යාපන සහතික සහ සුදුසුකම් සනාථ කරන අනෙකුත් සහතිකවල සහතික කළ පිටපත් ද සමඟ තම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය ද සහිතව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

06. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2026.05.25** වේ.

07. මෙම උසස් කිරීමට සමාන්තරව භාෂා පරිවර්තක සේවා ව්‍යවස්ථාවේ 10 වගන්තිය ප්‍රකාරව පවත්වනු ලබන තරඟ විභාගය ද ඉදිරියේදී පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.


එන්.යූ. නිෂාන් මෙන්ඩිස්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112- 699966
ෆැක්ස් : 0112- 690100
විද්‍යුත් ලිපිනය : gts.pubad@gmail.com

**ආදර්ශ අයදුම්පත්‍රය**

**<u>1994 ජූලි 26 දිනැති අංක 829/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද භාෂා පරිවර්තක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව රජයේ භාෂා පරිවර්තක සේවයේ විශේෂ පන්තියට උසස් කිරීම සඳහා වන අයදුම්පත්‍රය</u>**

1. සේවා ස්ථානය

   I. අමාත්‍යාංශය : ..........................................................................................................................

   II. දෙපාර්තමේන්තුව : ....................................................................................................................

   III. උප කාර්යාලය : .......................................................................................................................

2. නිලධාරියාගේ/ නිලධාරිනියගේ සම්පූර්ණ නම : ..................................................................................

   .............................................................................................................................. මයා / මිය / මෙනවිය

3. මුලකුරු සමග නම : .........................................................................................................................

4. නම වෙනස්කර ඇත්නම් සංශෝධිත නම : ..........................................................................................

   .......................................................................................................................................................

5. උපන් දිනය : .......................................... 6. ජාතික හැඳුනුම්පත් අංකය : ....................................................

7. ස්ථිර පෞද්ගලික ලිපිනය : ..........................................................................................................

.............................................................................................................................................................

8. දුරකථන අංකය ( පෞද්ගලික ) : ..............................................................

   ( කාර්යාලයීය ) : ..............................................................

9. රජයේ භාෂා පරිවර්තක සේවයට මුලින්ම පත් වූ දිනය ( I පන්තියට ) : ...............................................

   I. පත්වීම් ලිපියේ අංකය : ..............................................................

10. ඔබ සේවය ස්ථිර කර තිබේද? : ඔව් / නැත

    I. ස්ථිර කළ දිනය : ..................................................................

11. අධ්‍යාපන සුදුසුකම් :

    i. ..............................................................................................................................
    ..............................................................................................................................

    ii. ..............................................................................................................................
    ..............................................................................................................................

iii. ........................................................................................................................................
........................................................................................................................................

iv. ........................................................................................................................................
........................................................................................................................................

v. ........................................................................................................................................
........................................................................................................................................

12. භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය:..................................................

13. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ දිනය :.....................................................................

14. අදාළ භාෂා ප්‍රවීණතාවය සමත් වූ දිනය :.........................................................................................

15. ...................................................................................................................................................

අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / කාර්යාලයේ රජයේ භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ නිලධාරියෙකු / නිලධාරිනියක වශයෙන් සේවය කරන ...........................................................................................

..........................................................................................(සම්පූර්ණ නම) වන මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් අංක 829/7 දරණ 1994.07.26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද භාෂා පරිවර්තක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 11 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විශේෂ පන්තියට උසස් වීමට සුදුසුකම් ලබන බව ප්‍රකාශ කරමි.

දිනය: ........................................................ අත්සන: ...............................................................

## <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

.................................................................................................අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / කාර්යාලයේ I පන්තියේ රජයේ භාෂා පරිවර්තක තනතුරක් දරන ..........................................................

............................................................................................................ මහතා / මහත්මිය / මෙනෙවිය විශේෂ පන්තියට උසස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රයේ 1 සිට 14 දක්වා වූ තොරතුරු ඔහුගේ/ ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. මෙම නිලධාරියා / නිලධාරිනිය සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරමි.

1. නිලධාරියා / නිලධාරිනිය විසින් චක්‍රලේඛයේ අංක 04 මගින් දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන දිනය :

   ..............................................................................................................................................

2. නිලධාරියා / නිලධාරිනිය කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබේද? ..........................................................

3. නිලධාරියා / නිලධාරිනිය සේවා කාලය තුල ලබාගෙන ඇති අඩ වැටුප් / වැටුප් රහිත නිවාඩු විස්තර:

| **අඩ වැටුප් / වැටුප් රහිත නිවාඩු ලබාගත් කාලසීමාව** | **දින ගණන** | | | **හේතුව** |
|---|---|---|---|---|
| | **වර්ෂ** | **මාස** | **දින** | |
| | | | | |
| | | | | |
| | | | | |

4. උසස්වීම සඳහා ඉල්ලුම් කරනු ලබන දිනට නිලධාරියා / නිලධාරිනිය ඒකාබද්ධ සේවයේ රජයේ භාෂා පරිවර්තකයෙකු වශයෙන් සේවය කළ, සම්පූර්ණ සේවා කාලය :

   අවු: ............. මාස: ............. දින: ................

5. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කළ දිනය : ................................

6. නිලධාරියා / නිලධාරිනිය රජයේ භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම මගින් සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති ආකාරය :

   ***නිලධාරියා / නිලධාරිනිය සපුරා ඇති කාලසීමාව අනුව වගුව සකස් කර ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න**

| **අනු අංකය** | **වැටුප් වර්ධක දිනය** | **උපයාගත් වැටුප** | **වැටුප් වර්ධක වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාවේ ප්‍රමාණනකරුගේ නිර්දේශය*** | | | |
|---|---|---|---|---|---|---|
| | | | **ඉතා හොඳයි** | **හොඳයි** | **සතුටුදායකයි** | **අසතුටුදායකයි** |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

*( *අදාළ කොටුව තුළ √ යොදන්න. )*

7. ඒකාබද්ධ සේවයේ රජයේ භාෂා පරිවර්තකයෙකු වශයෙන් මේ දක්වා නිලධාරියාට / නිලධාරිනියට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද? ......................................

7.1 එසේනම් අදාළ තොරතුරු :-

   I. වරදේ ස්වභාවය ( උපලේඛන I හෝ II අනුව ): ..........................................................................

   II. දෙන ලද දඬුවම හා දඬුවමෙහි ස්වභාවය: ..........................................................................

   ..........................................................................................................................

   III. වැටුප් වර්ධක විලම්භනය කර තිබේනම් එම වර්ෂයන් : ...............................................................

| **කාලසීමාව** | **දින ගණන** | | | **හේතුව** |
|---|---|---|---|---|
| | **වර්ෂ** | **මාස** | **දින** | |
| | | | | |
| | | | | |
| | | | | |

**8. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :**

........................................... දින සිට මෙම නිලධාරියා / නිලධාරිනිය විශේෂ පන්තියට උසස් කිරීම නිර්දේශ කරමි. /නොකරමි.

දිනය : ......................................  දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන : ...................................

නම :

තනතුර :

නිල මුද්‍රාව :

**9. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :**

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහතින් සඳහන් කර ඇති නිර්දේශය මවිසින් ද නිර්දේශ කරමි.

දිනය : .....................................  අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන : ....................................

නම :

තනතුර :

නිල මුද්‍රාව :